## මිනිපේ ප්‍රාදේශීය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජූනි 19 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන, 2011 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 12 දින සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මිනිපේ ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

ප්‍රාදේශීය සභාව සතු අක්කර 42 රූඩ් 1 පර්චර්ස් 11 ක්වූ ඉඩම් හා ගොඩනැගිලි 36 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 13 කට අදාලව එකතුව රු.9,707,847 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,904,929 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,390,414 ක් විය.

## 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 560 | 653 | 323 |
| (ii) | බදු කුලී | 2,066 | 2,229 | 615 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,607 | 3,886 | 2 |
| (iv) | වෙනත් ආදායම් | 3,139 | 6,394 | 1,307 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 16,999 |
| (ii) මුද්දර ගාස්තු | 224,143 |

### 2.2.3 ජල ගාස්තු

-----------

ජල සම්බන්ධතා ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා 2011 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු රු.1,229,139 ක් විය.

2.2.4 කඩ කාමර කුලී

----------------

ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට රු.614,724 ක කඩකාමර කුලී හිඟ හිටව පැවතුණි.-

2.2.5 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

-----------------------------

සභාව අවසරයකින් තොරව බල ප්‍රදේශය තුල සම්ප්‍රේෂණ කුළුණු 09 ක් ස්ථාන ගත කර තිබුණ අතර, නාගරික සංවර්ධන අධිකාර පනත ක්‍රියාත්මක නොවන සභා බල ප්‍රදේශවලට අදාලව කුළුණුවලට අවසර ලබාදීමේදී සභා තීරණ අනුව ගාස්තු අයකල යුතු වුවද, ඒ සම්බන්ධව අවධානය යොමු වී නොතිබුණි.

2.3 නිශ්ක්‍රිය භෞතික සම්පත්

--------------------------

දේශිය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබා ගන්නා ලද ණය මුදලක් මගින් 1998 අගෝස්තු 18 දින රු.124,900 කට මිලදී ගන්නා ලද රෝද දෙකේ ට්‍රැක්ටරය සහ අත් ට්‍රැක්ටර් ට්‍රේලරය 2009 වර්ෂයේ සිට විගණන දින වු 2012 ඔක්තෝබර් 08 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන කාර්යාල භූමියේ ගාල්කර තිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

2011 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ වූ බැර ශේෂය රු.13,369 ක් විය.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) තොග පාලනය